# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත

---

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2008 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

මිල : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත

[සහතිකය සටහන් කළේ : 2008 පෙබරවාරි මස 19 වන දින ]

එල්. ඩී. — ඕ. 28/2005

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයක් පිහිටුවීම සඳහා ද, එකී රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අරමුණු සහ කර්තව්‍ය හඳුනාගැනීම සඳහා ද, එහි කළමනාකරණය සහ පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2008 අංක 05 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට බලාත්මක විය යුතු ය. — *ලුහුඬු නාමය.*

## I වන කොටස

## රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පිහිටුවීම

2. (1) මෙහි මින් මතු "මාණ්ඩලික විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය නම් වූ විද්‍යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය. — *රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පිහිටුවීම.*

(2) මාණ්ඩලික විද්‍යාලය, (1) වන උපවගන්තිය මගින් ඊට පවරා දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. මාණ්ඩලික විද්‍යාලය පිහිටුවනු ලැබුවේ යම් අරමුණු සඳහා ද, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා මාණ්ඩලික විද්‍යාලයේ කාර්යක්ෂම කළමනාකාරිත්වයක් හා පරිපාලනයක් සහතික කිරීමේ වගකීම, රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා භාරව ක්‍රියා කළ යුතු ය. — *මාණ්ඩලික විද්‍යාලය රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයාගේ වගකීම විය යුතු බව.*

2-PL 002552 —3,550 (2007/10)

මාණ්ඩලික විද්‍යාලයේ අරමුණු.

4. මාණ්ඩලික විද්‍යාලයේ අරමුණු වනුයේ —

(අ) සන්නද්ධ හමුදාවල නිලධරයන් අයත්වන අදාළ සේවාවල උචිත පත්වීම් සහ උසස්වීම් සඳහා ඔවුන් සූදානම් කිරීමට හා දැනුම ලබාදීමට, මාණ්ඩලික විද්‍යාලයේ දී පුහුණු කිරීම සඳහා තෝරාගනු ලැබූ එම නිලධරයන්ගේ වෘත්තිය දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීම;

(ආ) සාමකාමී අවස්ථා සහ යුද්ධය යන අවස්ථා දෙකේදීම එක් සේවාවක සහ ඒකාබද්ධ සේවා පසුබිමක අණ සහ මාණ්ඩලික කර්තව්‍ය යන අවස්ථා දෙකේදීම ඵලදායී ලෙස ක්‍රියා කිරීම සඳහා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණුව සඳහා තෝරා ගනු ලබන සන්නද්ධ හමුදාවල නිලධරයන් සූදානම් කිරීම සහ දැනුම ලබාදීම හා අණ සහ මාණ්ඩලික පත්වීම්වල ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා ඔවුන්ගේ කර්තව්‍ය සම්බන්ධයෙන් සාමාන්‍ය අධ්‍යාපනයක් දෙනු ලැබිය යුතු ය.

මාණ්ඩලික විද්‍යාලයේ කර්තව්‍ය.

5. ස්වකීය අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා, පහත සඳහන් කර්තව්‍ය සියල්ලම හෝ ඉන් යම් කර්තව්‍යයක් මාණ්ඩලික විද්‍යාලය වෙත පවරනු ලැබිය යුතු ය:—

(අ) මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවලින් ශිෂ්‍ය නිලධරයන් ඇතුළත් කර ගැනීම;

(ආ) මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත හමුදා ආයතනවලින් ශිෂ්‍ය නිලධරයන් ඇතුළත් කර ගැනීම;

(ඇ) අධ්‍යයන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි මාණ්ඩලික විද්‍යාලයේ දී රාජ්‍ය ආරක්ෂාවට සහ හමුදා කළමනාකාරිත්වයට අදාල අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා රාජ්‍ය නිලධරයන් ඇතුළත් කර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී නියම කරනු ලබන ගාස්තු අයකර ගැනීම;

(ඈ) (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ තෝරා ගනු ලැබුවා වූ ද, තෝරාගත් අධ්‍යයන පාඨමාලාවල ප්‍රවීණත්වය ලබාගෙන ඇත්තා වූද, ශිෂ්‍ය නිලධරයන් සඳහා විභාග පැවැත්වීම;

(ඉ) අධ්‍යයන පාඨමාලා සාර්ථක ලෙස හැදෑරීමේ දී ශිෂ්‍ය නිලධරයන් සහ රාජ්‍ය නිලධරයන් වෙත සහතික නිකුත් කිරීම සහ පී. එස්. සී. (මාණ්ඩලික විද්‍යාලයෙන් සමත් වී ඇත.) යන නිල නාමය ප්‍රදානය කිරීම සහ පැවරීම;

(ඊ) මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල, විද්‍යාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට අවශ්‍ය උපකරණ ලබාදීම සහ නඩත්තු කිරීම;

(උ) මාණ්ඩලික විද්‍යාලයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන මහාචාර්ය පදවි, ආචාර්ය පදවි සහ වෙනත් තනතුරු ඇති කිරීම;

(ඌ) මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය සේවා නියුක්තයන් සහ අනුයෝජිතයන් පත් කිරීම;

(එ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම;

(ඒ) මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට සහ එවැනි ඇප මත මුදල් ණයට ගැනීම හෝ ඉපයීම;

(ඔ) මේ පනත මගින් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාග දීමක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් මාණ්ඩලික විද්‍යාලය වෙත සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළ භාර ගැනීම හෝ දැරීම සහ එවැනි යම් නිශ්චල සහ චංචල දේපලක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, හිමිකර දීම, රික්තවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඕ) කෙලින්ම හෝ මාණ්ඩලික විද්‍යාලය වෙනුවෙන් බලය පවරන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් මාණ්ඩලික විද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට ඇතුළත්වීම, ඒවා ඉටුකිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ක) කළමනාකරණ මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයට අරමුදල් ආයෝජනය කිරීම;

(ග) ස්වකීය අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය, යෝග්‍ය හෝ ආනුෂංගික සියලු ක්‍රියා කිරීම.

මාණ්ඩලික විද්‍යාලයේ මුද්‍රාව.

6. (1) මාණ්ඩලික විද්‍යාලයේ මුද්‍රාව කළමනාකරණ මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට මාණ්ඩලික විද්‍යාලයේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මාණ්ඩලික විද්‍යාලයේ මුද්‍රාව සභාපතිවරයා සහ කළමනාකරණ මණ්ඩලයේ තවත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට මාණ්ඩලික විද්‍යාලයේ මුද්‍රාව තබනු ලබන විට, සභාපතිවරයාට පැමිණ සිටීමට නොහැකි වන අවස්ථාවක, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලබන කළමනාකරණ මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට අනුකූලව එම සාධනපත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබීමට බලය තිබිය යුතු ය.

(4) මාණ්ඩලික විද්‍යාලයේ මුද්‍රාව තබනු ලැබූ සියලු සාධනපත්‍ර සහ ලේඛන පිළිබඳ නාමලේඛනයක් මාණ්ඩලික විද්‍යාලය විසින් පවත්වාගෙන යා යුතු ය.

## II වන කොටස

## මාණ්ඩලික විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය සේනාවිධායකවරයා සහ අධ්‍යයන මණ්ඩලය සහ විනය මණ්ඩලය

මාණ්ඩලික විද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

7. (1) මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු අතර, එම මණ්ඩලය රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විසින්

පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා;

(ආ) සභාපතිවරයා නොමැති විට මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දැරිය යුතු රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා;

(ඇ) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී;

(ඈ) යුධ හමුදාපතිවරයා, නාවික හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයා;

(ඉ) භාණ්ඩාගාර භාර ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඊ) කැලණිය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා;

(උ) මාණ්ඩලික විද්‍යාලයේ සේනාධිනායකවරයා වශයෙන් තත්කාලයේ ධුර දරන තැනැත්තා; සහ

(ඌ) මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු මාණ්ඩලික විද්‍යාලයේ සම්බන්ධීකරණ බ්‍රිගේඩියර්වරයා වශයෙන් තත්කාලයේ ධුර දරන තැනැත්තා.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද අතිරේක ලේකම්වරයා, මාණ්ඩලික විද්‍යාලය විෂයය අමාත්‍යාංශය විසින් භාර දෙනු ලැබූ තැනැත්තකු විය යුතු ය.

8. (1) මණ්ඩලය විසින් කලින් කල අවශ්‍ය යයි සලකනු ලබන ශාඛාවලින් මාණ්ඩලික විද්‍යාලය සංයුක්ත විය යුතු ය. මාණ්ඩලික විද්‍යාලයේ ශාඛා.

(2) ශ්‍රී ලංකාවේ අදාළ සන්නද්ධ හමුදාවල හමුදාපතිවරුන්ගේ නිර්දේශ මත මණ්ඩලය විසින් මාණ්ඩලික විද්‍යාලයේ ඉගැන්වීමේ කාර්ය මණ්ඩලයට සහ ස්ථිර කාර්ය මණ්ඩලයට නිලධරයන් පත් කළ යුතු අතර, ඔවුන් කලින් ධුරය අත්හළහොත් මිස අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල අදාල හමුදාපතිවරුන්ගේ නිර්දේශ මත මණ්ඩලය විසින් මාණ්ඩලික විද්‍යාලයේ සෙසු නිලයන් දරන කාර්ය මණ්ඩලය පත් කරනු ලැබිය යුතු අතර, ඔවුන් කලින් ධුරය අත්හළහොත් මිස, අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

**රැස්වීම් සහ මණ්ඩලයේ රැස්වීම්වල ගණපූරණය.**

9. (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ සහ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතුවලට අදාළ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය:

එසේ වුව ද, එම සාමාජිකයන් පස්දෙනාගෙන් අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනකු ශ්‍රී ලංකාවේ සන්නද්ධ සේවාවල හමුදාපතිවරුන්ගෙන් සමන්විත විය යුතු ය.

**මණ්ඩලයේ රැස්වීම්.**

10. මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

**සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම මගින් මණ්ඩලයේ කටයුතු අවලංගු නොවිය යුතු බව.**

11. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එම සාමාජිකයන් පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

**වාර්ෂික ඇස්තමේන්තු.**

12. මාණ්ඩලික විද්‍යාලය සඳහා අවශ්‍ය මූල්‍යමය වෙන්කිරීම ඉටු කර ගැනීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, අවස්ථාවෝචිත පරිදි, වාර්ෂික ඇස්තමේන්තු හෝ පරිපූරක ඇස්තමේන්තු රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**සේනාවිධායකවරයා.**

13. (1) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා විසින් මෙහි මින් මතු "සේනාවිධායකවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන, මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායකවරයා වශයෙන්, පිළිවෙලින් යුධ හමුදාවේ මේජර් ජනරාල් නිලය හෝ නාවික හමුදාවේ රියර් අද්මිරාල් නිලය හෝ ගුවන් හමුදාවේ එයා වයිස් මාෂල් නිලය දරන සුදුසුකම් ලත් ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය යුතු අතර, මහු මාණ්ඩලික විද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. සේනාවිධායකවරයා විශ්‍රාම යෑමෙන්, මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය අත්හළහොත් මිස, අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

(2) තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා රාජ්‍ය ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා ඉදිරිපත් කරනු ලබන ලිපියක් මගින් සේනාවිධායකවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් හේතු දක්වා සේනාවිධායකවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) තමා සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති සේනාවිධායකවරයා එම නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දිනයේ දී හෝ එම නියමයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් දිනයක දී සිය ධූරයෙන් ඉවත්ව යා යුතු ය.

(5) සේනාවිධායකවරයා වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තා-

(අ) සේනාවිධායකවරයා වශයෙන් සිය ධූරය අවසන්වීමට පෙර ධූරය අත්හැරීමේ දී හෝ ඔහු සාමාජිකයකු වන ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වීම අවසානවීමේ දී අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන සුදුසුකම්ලත් නිලධරයකු සේනාවිධායකවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු අතර, කලින් ධූරය අත්හළහොත් මිස ඔහු අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ධූර දැරිය යුතු ය; හෝ

(ආ) අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව තම ධූරයේ කාර්ය ඉටු කිරීමට සේනාවිධායකවරයාට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ කාල සීමාව තුළ දී ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, යුධ හමුදාවේ, නාවික හමුදා වේ හෝ ගුවන් හමුදාවේ ප්‍රධාන උපදේශක නිලයක් දරන ජ්‍යෙෂ්ඨතම තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

සේනා විධායකවරයාගේ කාර්ය.

14. (1) සේනාවිධායකවරයා මණ්ඩලයේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මාණ්ඩලික විද්‍යාලයේ කටයුතුවලට විධාන කිරීම සහ මාණ්ඩලික විද්‍යාලයේ කර්තව්‍ය ඉටුකිරීම භාරව ක්‍රියා කළ යුතු ය. තව ද, ඔහු සේවා නියුක්තයන්ගේ සහ ශිෂ්‍ය නිලධරයන්ගේ සම්පූර්ණ පරිපාලනය ද විනය පාලනය ද භාරව සිටිය යුතු ය.

(2) සේනාවිධායකවරයා විසින් අවශ්‍ය යයි කලින් කල සලකනු ලබන ඔහුගේ ඇතැම් කාර්යයන් මණ්ඩලයේ අනුමතය ඇතිව මාණ්ඩලික විද්‍යාලයේ යම් සේවා නියුක්තයකුට ලිඛිතව පවරනු

ලැබිය හැකි ය. එසේ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් සේවා නියුක්තයකුට ද, එම සේවා නියුක්තයා විසින් සේනාවිධායකවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට යටත්ව ඒවා ඉටු කරනු ලැබිය යුතු ය. එසේ පැවරීම නොතකා අවශ්‍ය අවස්ථාවන්හි දී එම කර්තව්‍ය ඉටු කිරීමට සේනාවිධායකවරයා ට බලය ඇත.

(3) මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධරයන් සඳහා සැපයිය යුතු වෛද්‍ය, ශුභසාධන සහ ක්‍රීඩා පහසුකම් පිළිබඳව සේනාවිධායකවරයා විසින් අවශ්‍ය පියවර ගත යුතු ය.

(4) මාණ්ඩලික විද්‍යාලයේ සුරක්ෂිතභාවය හා ආරක්ෂාව සඳහා සේනාවිධායකවරයා විසින් අවශ්‍ය පියවර ගත යුතු ය.

මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලය.

15. (1) ශාස්ත්‍රීය සහ රාජ්‍ය ආරක්ෂක අධ්‍යයනයන්ට අදාළ මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු අධ්‍යයන මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය. අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) 13 වන වගන්තිය යටතේ පත් කරන ලද සේනාවිධායකවරයා;

(ආ) කැළණිය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලැබූ නියෝජිතයෙක්;

(ඇ) යුධ හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ ප්‍රධාන උපදේශකයන්.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව සහ මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන යම් රීතිවලට යටත්ව, අධ්‍යයන මණ්ඩලය විසින්, තමන් වෙත පවරා ඇති හෝ සහකර දී ඇති කර්තව්‍ය ඉටු කළ යුතු ය.

(3) මාණ්ඩලික විද්‍යාලයේ ඉගැන්වීම්, පුහුණුව, පර්යේෂණ සහ විභාග පිළිබඳව අධ්‍යයන මණ්ඩලයට පාලනයක් සහ විධානයක් තිබිය යුතු ය.

(4) පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය සහ කර්තව්‍ය කිරීම සහ ඉටුකිරීම අධ්‍යයන මණ්ඩලය භාරයේ තිබිය යුතු ය :—

(i) මාණ්ඩලික විද්‍යාලය විසින් උගන්වනු ලබන අධ්‍යයන පාඨමාලා සහ එම පාඨමාලාවල විෂය නිර්දේශ හඳුනාගෙන ඒවා මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ii) මාණ්ඩලික විද්‍යාලය විසින් උගන්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රදානය කරනු ලබන උපාධි, ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳව තීරණය කිරීම;

(iii) එවැනි උපාධි, ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබීමට කැමති ශිෂ්‍යයන් විසින් ලැබිය යුතු පුහුණුව, සමත්විය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි හඳුනාගැනීම;

(iv) මණ්ඩලය විසින් අධ්‍යයන මණ්ඩලය වෙත යොමු කරනු ලබන යම් කරුණක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම;

(v) මාණ්ඩලික විද්‍යාලය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩ සටහන්, ඉගැන්වීමේ වැඩ සටහන්, පර්යේෂණ වැඩ සටහන් හෝ විභාගවලට අදාළ කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම;

(vi) යම් විශේෂිත විෂයයක් හෝ විෂය පිළිබඳව සලකා බැලීමේ සහ වාර්තා කිරීමේ කාර්ය සඳහා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම;

(vii) පහත සඳහන් කරුණු පිළිබඳව මණ්ඩලය වෙත වාර්තා කිරීම :—

(අ) අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීම සඳහා වූ අවශ්‍යතාවයන්;

(ආ) ගුරුවරුන් හෝ විභාග පරීක්ෂකවරුන් වශයෙන් පිළිගැනීමට සුදුසු තැනැත්තන්;

(ඇ) නියමිත විභාග සමත්වීමෙන් පසු සහ වෙනත් නියමිත කොන්දේසි සපුරාලීමෙන් පසු උපාධි, ඩිප්ලෝමා සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතාවන් ප්‍රදානය කිරීම සඳහා සුදුසු තැනැත්තන්.

(viii) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරග කිරීමේ ක්‍රම සහ කොන්දේසි හඳුනාගැනීම;

(ix) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම් සඳහා සුදුසු තැනැත්තන් නම් කිරීම.

විනය මණ්ඩලය.

16. මණ්ඩලය විසින්, සේනාවිධායකවරයා විමසා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විනය මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය :—

(අ) අදාළ හමුදා අංශයේ ප්‍රධාන උපදේශකවරයා; සහ

(ආ) සේනාවිධායකවරයාගේ මතය අනුව යම් විශේෂිත විෂමාචාරයක් එලදායී ලෙස සමථයකට පත් කිරීම සඳහා අවශ්‍ය වෙනත් යම් නිලධරයෙක්.

විනය පද්ධතිය සහ විනය පාලනය ක්‍රියාත්මක කිරීම.

17. (1) සෑම ශිෂ්‍ය නිලධරයෙක් ම මාණ්ඩලික විද්‍යාලයේ විනය පද්ධතියකට යටත් විය යුතු ය. විනය පද්ධතිය නියෝග මගින් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) විනය පද්ධතිය කඩකර අසුවන යම් ශිෂ්‍ය නිලධරයෙක් හෝ විනය කඩකිරීමක් සම්බන්ධයෙන් විනය මණ්ඩලය විසින් වරදකරු කරනු ලබන් යම් ශිෂ්‍ය නිලධරයෙක්, එම ශිෂ්‍ය නිලධරයාගේ ක්‍රියා කලාපය, මාණ්ඩලික විද්‍යාලයේ යහ පැවැත්මට යෝග්‍ය නොවන බවට විනය මණ්ඩලය විසින් කරනු ලබන නිර්දේශයක් මත, සේනාධිවිධායකවරයා විසින් අධ්‍යයන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(3) ස්ථිර කාර්ය මණ්ඩලයේ විනය පාලනය සේනාවිධායකවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය පවරනු ලබන මාණ්ඩලික විද්‍යාලයේ වෙනත් යම් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) මාණ්ඩලික විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලයේ විනය පාලනය පවත්වා ගෙන යාම, මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලින් නිශ්චිතව දැක්වෙන කාර්ය පටිපාටිය අනුව සිදු විය යුතු ය.

(5) ශිෂ්‍ය නිලධරයන්ගේ සෑම විෂමාචාර ක්‍රියාවක් ම, එම නිලධරයන් අයත් සන්නද්ධ සේවාවේ නීති සහ නියෝග ප්‍රකාරව අවශ්‍ය යයි සලකනු ලබන විනය ක්‍රියා මාර්ග, ආරම්භ කිරීම සඳහා සේනාවිධායකවරයා විසින් එම නිලධරයා අයත් සන්නද්ධ සේවාවේ හමුදාපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(6) සිතා මතා හෝ නොසැලකිලිමත් ලෙස ආණ්ඩුවේ දේපළවලට අලාභහානි සිදු කිරීම සඳහා වගකිව්යුතු බවට තීරණය කරනු ලබන සෑම ශිෂ්‍ය නිලධරයෙක් ම, එම අලාභ සඳහා මාණ්ඩලික විද්‍යාලයට වන්දි පූරණය කිරීමට යටත් වේ.

## III වන කොටස

## මුදල්

18. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයීය අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. මාණ්ඩලික විද්‍යාලයේ අරමුදල.

(2) අරමුදල කළමනාකරණය කිරීමේ, පාලනය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු ය.

19. පහත සඳහන් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :— අරමුදලට කරනු ලබන ගෙවීම්.

(අ) මාණ්ඩලික විද්‍යාලයේ කළමනාකරණය සහ පරිපාලනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන ලෙස මාණ්ඩලික විද්‍යාලයට ලැබෙන සියලු මුදල්;

(ඇ) මාණ්ඩලික විද්‍යාලය විසින් උගන්වනු ලබන අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල්;

(ඈ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී මාණ්ඩලික විද්‍යාලයට ලැබෙන සියලු මුදල්.

20. අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය :— අරමුදලින් ගෙවිය යුතු මුදල්.

(අ) මාණ්ඩලික විද්‍යාලය පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වියදම්;

(ආ) බාහිර කථිකාචාර්යවරුන්ට ගාස්තු ගෙවීම;

(ඇ) මාණ්ඩලික විද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සියලු ගෙවීම්.

ගිණුම් විගණනය කිරීම.

21. (1) නිසි ගිණුම් පොත් තබා ගැනිමට ද ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම්, වත්කම් හා බැරකම් පිළිබඳ ගිණුම් සහ මාණ්ඩලික විද්‍යාලයේ වෙනත් සියලු මූල්‍ය වියදම් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම සඳහා 22 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ගණකාධිකාරිවරයාට මණ්ඩලය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) මාණ්ඩලික විද්‍යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(4) මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික ගිණුම් ගණකාධිකාරිවරයා විසින් පිළියෙල කළ යුතු අතර, එම ගිණුම් සේනාවිධායකවරයා හරහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ගණකාධිකාරිවරයකු පත් කිරීම.

22. (1) මාණ්ඩලික විද්‍යාලයට මණ්ඩලය විසින් පත් කරනු ලබන ගණකාධිකාරිවරයකු සිටිය යුතු ය.

(2) මේ පනතේ 18 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ මාණ්ඩලික විද්‍යාලයේ අරමුදල් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම සඳහා ගණකාධිකාරිවරයා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායකවරයාට වගකිව යුතු ය.

පාරිශ්‍රමික ගෙවීම.

23. (1) ශිෂ්‍ය නිලධරයන් ලෙස මාණ්ඩලික විද්‍යාලයට සේවයේ යොදවා ඇති හෝ අනුයුක්ත කර ඇති සියලු ආරක්ෂක සේවා සාමාජිකයන්ට අදාළ වන ඔවුන්ගේ අදාළ සේවයේ ගෙවීම් නියෝගවල සඳහන් කර ඇති පාරිශ්‍රමික හා දීමනා ලබාගැනීමට ඔවුන්ට හිමිකම් ඇත.

(2) ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා යටතේ දැනට පුහුණු ආයතනවලට පත්කර ඇති ආරක්ෂක සේවා සාමාජිකයන්ට ගෙවනු ලබන අතිරේක දීමනා ලබාගැනීම සඳහා ඉහත සඳහන් මාණ්ඩලික විද්‍යාලයේ සියලු ආරක්ෂක සේවා සාමාජිකයන්ට හිමිකම් ඇත.

(3) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන වේතන් අතිරේක දීමනාවලට ද ඉහත සඳහන් මාණ්ඩලික විද්‍යාලයේ ආරක්ෂක සේවා සාමාජිකයන්ට ද හිමිකම් ඇත.

(4) මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධරයකුගේ පුහුණු කාලය, විශ්‍රාම වැටුපේ, පාරිතෝෂික දීමනාවල සහ දීමනාවල කාර්ය සඳහා ගණන් ගන්නා සේවා කාලයක් බවට සලකනු ලැබිය යුතු ය.

24. මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මණ්ඩලය වෙත පවරා ඇති කර්තව්‍ය ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය මුදල් අත්තිකාරම් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ණයට ගනු ලැබිය හැකි ය. මණ්ඩලයේ ණයට ගැනීමේ බලතල.

## IV වන කොටස

## සාමාන්‍ය

25. (1) මාණ්ඩලික විද්‍යාලය විසින් ශිෂ්‍ය නිලධරයන් සඳහා ලබාදෙන අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් සේනාවිධායකවරයාගේ නිර්දේශ මත මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් රීති සෑදිය යුතු බව.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම එසේ සෑදීමෙන් පසු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, ඉන්පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

26. (1) මේ පනත මගින් නියම් කිරීමට නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හා නියෝග සෑදීමට මේ පනත මගින් බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු කළමනාකරණය කිරීම හෝ පරිපාලනය කිරීම;

(ආ) 17 වන වගන්තිය මගින් නියම කර ඇති විනය පද්ධතිය සකස් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝගය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට හෝ ගැසට් පත්‍රයේ සඳහන් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මාණ්ඩලික විද්‍යාලයේ විධානය මත ගනු ලැබූ ක්‍රියා සඳහා ආරක්ෂාව.

27. (1) (අ) මේ පනත යටතේ මාණ්ඩලික විද්‍යාලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා මාණ්ඩලික විද්‍යාලයට එරෙහිව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මාණ්ඩලික විද්‍යාලයේ විධානය යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා මාණ්ඩලික විද්‍යාලයේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ අනුයෝජිතයකුට එරෙහිව,

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මාණ්ඩලික විද්‍යාලය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මාණ්ඩලික විද්‍යාලය විසින් දරන ලද යම් වියදමක් සහ එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී මාණ්ඩලික විද්‍යාලයට ගෙවන ලද හෝ එය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මාණ්ඩලික විද්‍යාලයේ විධානය යටතේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම

ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම මුදල ඔහු විසින් අයකර ගනු ලැබුවහොත් මිස, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

28. මණ්ඩලයේ සාමාජිකයන් සහ මාණ්ඩලික විද්‍යාලයේ සියලු නිලධරයන් හා සේවකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ මාණ්ඩලික විද්‍යාලයේ නිලධරයන් සහ සේවකයන් රජයේ නිලධාරින් ලෙස සැලකිය යුතු බව.

29 මාණ්ඩලික විද්‍යාලය (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව මාණ්ඩලික විද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

30 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන මේ පනත යටතේ පිහිටුවනු ලැබූ මාණ්ඩලික විද්‍යාලයට සහ එය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

3 මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

32 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

අර්ථ නිරූපණය.

'ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා'' යන්නෙන් පිළිවෙලින් (357 වන අධිකාරය වූ) යුධ හමුදා පනත, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ;

''අංශය' යන්නෙන් යම් විශේෂිත සේවාවකට හෝ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයට අදාළව විශේෂිත පුහුණුවක් පවත්වන මාණ්ඩලික විද්‍යාලයේ ශාඛාවක් අදහස් වේ. සාමාන්‍යයෙන් එවැනි අංශ තුනක් තිබෙන අතර ඒවා යුධ හමුදා අංශය, නාවික හමුදා අංශය සහ ගුවන් හමුදා අංශය නම් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා